# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 57/73.

**විකිණීම සඳහා නිවාස ඉදිකරන තැනැත්තන්ට ඇතැම් බදු සහන දීම පිණිස ද එයට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් නිවාස විකිණීමෙන් ලැබෙන ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

2. මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසුව හා 1976 දෙසැම්බර් මස තිස් එක් වන දිනට පෙර යම් තැනැත්තකු විසින් ඉදි කිරීම ආරම්භ කරන ලද යම් නිවාසයක් මෙහි මින් මතු සැලැස්වෙන විධිවිධානවලට යටත්ව ඒ තැනැත්තා විසින් ප්‍රථම වරට විකුණනු ලබන අවස්ථාවක—

(අ) එම නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් නොඉක්මවන්නේ නම් හා එය විකුණනු ලැබූ මිල රුපියල් දස දහසක් නොඉක්මවන්නේ නම් ඒ විකිණීමෙන් ලැබෙන ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය;

තව ද

(ආ) (i) එම නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් නොඉක්මවන්නේ නම් හා එය විකුණනු ලැබූ මිල රුපියල් දස දහසක් ඉක්මවන්නේ නම්, හෝ

(ii) එම නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයක් ඉක්මවතත් වර්ග අඩි එක් දහසක් නොඉක්ම වන්නේ නම්,

ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමින් සියයට පනහක් ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.

ඇතැම් නිවාස විකිණීමෙන් ලැබූ ලාභවලින් හා ආදායමින් සමාගම් විසින් ප්‍රකාශ කරනු ලබන ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් විය යුතු බව.

3. (1) සමාගමක් විසින් එහි කොටස් හිමියන්ට ගෙවනු ලබන යම් ලාභාංශයක් හෝ එම ලාභාංශයේ යම් කොටසක් 2 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වූ ලාභවලින් හා ආදායමින් වූ විට ඒ ලාභාංශය හෝ එහි කොටස ආදායම් බද්දෙන් නිදහස් වන අතර 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි 25 (1) (ආ) වන සහ 27 (1) වන වගන්තිවල විධිවිධාන එම ලාභාංශය හෝ එහි කොටස සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ලාභාංශයක් ගෙවීමෙහි ලා ලියන ලද හෝ පිළියෙල කරන ලද ගෙවුම් බල පත්‍රයක්, චෙක්පතක් හෝ වෙනත් ඇණවුමක් නිකුත් කරන සෑම තැනැත්තකු විසින් එම ලාභාංශයෙහි ඇතුළත්ව ඇත්තා වූ, 2 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් ලාභවල සහ ආදාය මෙහි ප්‍රමාණය සඳහන් ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් එයට ඇමිණිය යුතු ය.

2—ජ 01625—11,382 (73/10)

අතිරික්ත අනුබද්ධ ඉඩම සමග නිවාස විකිණීම.

4. 2 වන වගන්තියෙහි සඳහන් යම් විකිණීමක්, නිවාසයට අනුබද්ධ ඉඩමක් ඇතුළුව මහා නගර සභා ප්‍රදේශවල හෝ නගරසභා ප්‍රදේශවල නම් පර්චස් දහයකට වැඩි සහ මහා නගර සභා ප්‍රදේශ හෝ නගරසභා ප්‍රදේශ නොවන ප්‍රදේශවල නම් පර්චස් විස්සකට වැඩි ඉඩම් ප්‍රමාණයක පිහිටා ඇති නිවාසයකට අදාළ වන අවස්ථාවක, ඒ අනුබද්ධ ඉඩමෙන් අවස්ථාවෝචිත පරිදි පර්චස් දහයකට හෝ පර්චස් විස්සකට වැඩි කොටස විකිණීමෙන් ලැබුණේ යයි දේශීය ආදායම් කොමසාරිස් අදහස් කරන ලාභ සහ ආදායම 2 වන වගන්තිය යටතේ දෙන ලද ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ කාර්යයන් සඳහා නොසලකා හැරිය යුතු ය:

එසේ වුවද 2 වන වගන්තියෙහි සඳහන් යම් විකිණීමක් තට්ටු නිවාසයක් සම්බන්ධයෙන් වූ හා ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ 9 (1) වන වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව එයට අනුබද්ධ ඉඩම මහා නගර සභා ප්‍රදේශවල හෝ නගරසභා ප්‍රදේශවල නම් පර්චස් පහක් හෝ මහා නගර සභා ප්‍රදේශ හෝ නගරසභා ප්‍රදේශ නොවන ප්‍රදේශවල නම් පර්චස් දහයක් ඉක්මවන්නා වූත් අවස්ථාවක ඒ අනුබද්ධ ඉඩමෙන් අවස්ථාවෝචිත පරිදි පර්චස් පහකට හෝ පර්චස් දහයකට වැඩි කොටස විකිණීමෙන් ලැබුණේයයි දේශීය ආදායම් කොමසාරිස් අදහස් කරන ලාභ සහ ආදායම 2 වන වගන්තිය යටතේ දෙන ලද ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ කාර්යයන් සඳහා නොසලකා හැරිය යුතුය.

කුලියට සින්නවීමේ විකිණීම.

5. 2 වන වගන්තියෙහි සඳහන් යම් විකිණීමක් කුලියට සින්න වීමේ කොන්දේසි පිට වූ විකිණීමක් වන අවස්ථාවක—

(අ) එම කොන්දේසි යටතේ විකිණීමේ ගිවිසුමට එළඹි දිනයෙහි එම විකිණීම කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය;

තවද,

(ආ) ගැණුම්කරු විසින් ගෙවිය යුතු මුදලින්, ඔහු විසින් ගෙවිය යුතු පොලිය වශයෙන් සැලකෙන ප්‍රමාණය 2 වන වගන්තිය යටතේ දෙන ලද ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ කාර්යයන් සඳහා නොසලකා හැරිය යුතු ය.

2 වන වගන්තිය අදාළ වන නිවාස ඒකාබද්ධ කිරීම තහනම් කිරීම.

6. (1) 2 වන වගන්තියෙන් ප්‍රදානය කරන ලද ආදායම් බදු නිදහස දී ඇත්තාවූ හෝ දීමට ඇත්තාවූ යම් නිවාසයක අයිතිකරු බවට පත්වන කිසිම තැනැත්තකු විසින්—

(අ) ඒ නිවාසය හෝ එහි කොටසක් එවැනි වෙනත් යම් නිවාසයක් සමග හෝ එහි කොටසක් සමග ඒකාබද්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීමට සැලැස්වීම හෝ අවසර දීම; හෝ

(ආ) ඒ නිවාසය හෝ එහි කොටසක් හා එවැනි වෙනත් යම් නිවාසයක් හෝ එහි කොටසක් හා අතර යම් ඉදිකිරීමකින් සම්බන්ධ කිරීමක් ඇති කිරීම හෝ ඇති කිරීමට සැලැස්වීම හෝ අවසර දීම

නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

7. (1) මේ පනතෙහි විධිවිධාන හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ අනනුමතයේ දිනයෙහි සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. එසේ අනුමත කරනු ලැබූ සෑම නියෝගයක් ම එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බල පවත්වන්නේ ය.

8. (1) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් කඩ කරන හෝ එයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය. වැරදි.

(2) 6 වන වගන්තිය යටතේ වූ වරදක් නොවන මේ පනත යටතේ වූ වෙනත් වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි — අර්ථ නිරූපණය.

"තට්ටු නිවාසය" යන්නෙන් මහල් එකකට වැඩි ගණනක් ඇති ගොඩනැගිල්ලක වූ අංග සම්පූර්ණ ගෘහ්‍ය කාමර සමූහයක් අදහස් වේ;

"දේශීය ආදායම් කොමසාරිස්", "සමාගම" සහ "ලාභ සහ ආදායම" යන යෙදුම්වලට, පිළිවෙලින්, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි ඒ යෙදුම් සඳහා දී ඇති අර්ථ ම ඇත්තේ ය;

"නගරසභා ප්‍රදේශය" යන්නෙන් නගර සභාවක පරිපාලන සීමා තුළ පිහිටි ප්‍රදේශයක් අදහස් වේ;

"නිවාසය" යන්නෙන් ප්‍රධාන වශයෙන් හෝ හුදෙක් වාසය කිරීමේ කාර්යයන් සඳහා ඉදි කරන ලද්දා වූ ද වෙනම ප්‍රවේශයක් ඇත්තා වූ හා වාසය කරන වෙනත් ස්ථානයකට ඒ ඔස්සේ යා නොහැක්කා වූ ද වාසය සඳහා වූ තනි ඒකකයක් (එයට අනුබද්ධ ඉඩමත් සමඟ) අදහස් වේ;

"බිම් ප්‍රමාණය" යන්න නිවාසයක් සම්බන්ධයෙන් යෙදෙන විට බිත්තිවල ඝනකම හැර නිවාසයේ බිමෙහි වර්ග ප්‍රමාණය ඉන් අදහස් වේ;

"මහා නගර සභා ප්‍රදේශය" යන්නෙන් මහා නගර සභාවක පරිපාලන සීමා තුළ පිහිටි ප්‍රදේශයක් අදහස් වේ;

"විකිණීම" යන්න නිවාසයක් සම්බන්ධයෙන් යෙදෙන විට ඉදිකිරීම සම්පූර්ණ කර ඇති නිවාසයක් විකිණීම ඉන් අදහස් වේ.